# සිංහල භාෂාව හා සාහිත්‍යය

## 11 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

**ක්‍රියාකාරකම i**

**කෙටි පිළිතුරු ලියන්න.**

1.

i. ධම්මපද නම් ගාථා සංග්‍රහයට ලියූ අටුවාවේ නම කුමක් ද?

ii. එහි රචකයා නම් කරන්න.

2.

i. සද්ධර්මරත්නාවලියේ ග්‍රන්ථාවසානයේ කර්තෘ සන්දර්ශන ගාථාවෙහි සරලාර්ථය දක්වන්න.

ii. මේ ග්‍රන්ථය කෙබඳු ශ්‍රාවක පිරිසක් අරමුණු කොට ගෙන ලියනු ලැබූවක් ද?

3.

i. පාලි කතා වස්තූන් මුල් කොට ගෙන සිංහලෙන් කතා කීමේ ශෛලිය හඳුන්වන්නේ කුමන නමකින් ද?

ii. උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව සද්ධර්මරත්නාවලියේ කීවෙනි කතා වස්තුව ද?

4.

i. සද්ධර්මරත්නාවලිය රචනා කළ යුගය නම් කරන්න.

ii. එවක රාජ්‍ය පාලකයාගේ නම ලියන්න.

5.

i. සද්ධර්මරත්නාවලී භාෂාවෙහි කැපී පෙනෙන ලක්ෂණ දෙකක් නම් කරන්න.

ii. එහි කතා වස්තුවල ආකෘතියේ පොදු ලක්ෂණ දෙකක් දක්වන්න.

අන්තර්ගතය : එච්.එම්.ජේ.එස්. කුමාරසිංහ - ආනන්ද විද්‍යාලය, කොළඹ 10.
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල.

Copyright©www.e-thaksalawa.moe.gov.lk

**ක්‍රියාකාරකම ii**

1. "ලදොත් ජීවත් වෙමි. නො ලදොත් මියෙමි."

i. මෙලෙස සිතූ අයගේ නම කුමක් ද?

ii. ලබා ගැනීමට ආශා කළ කෙනා කවු ද?

2. "මදුව විකුණන්නා නැත"

i. මේ ප්‍රකාශය කවරකු විසින් කා හට කුමන අවස්ථාවේ කුමක් අරභයා කරන ලද්දක් ද?

ii. ශිල්පයක් නො දත් තැනැත්තාට දියණිය විවාහ කර දෙන්නේ කුමන ප්‍රයෝජනයක් සලකා ගෙන ද?

3. "තොප නිසා විද්දත් වූවා මදින් නපුරුත් ඇසුව මනා ද?"

i. ඇසූ නපුරු බස් මොනවා ද?

ii. ඉක්බිති ඔහු සිදු කළේ කුමක් ද?

4. " අපට භයෙක් නැතැ"

i. මෙසේ පැවසීමට හේතුව කුමක් ද?

ii. එය ඇසූ පිරිස ඉක්බිති සිදු කළේ කුමක් ද?

5. "බත් පාත්‍රයක් පිළිගන්වා ගන්ට පාත්‍රය ගෙනව මැනවැ"

i. මෙය කී හා ඇසූ අය යමින් සිටියේ කුමකට ද?

ii. දන් පිරිනැමූ පසු ව අදාළ ස්ත්‍රිය භික්ෂුව ගැන සැමියාට කීවේ කුමක් ද?

අන්තර්ගතය : එච්.එම්.ජේ.එස්. කුමාරසිංහ - ආනන්ද විද්‍යාලය, කොළඹ 10.
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල.

Copyright©www.e-thaksalawa.moe.gov.lk

**ක්‍රියාකාරකම iii**

1. " වායෝධාත්වාධික රූප කලාප විකාරයක් බලවත් නියා යයි නොසිතා...."

i. පාඨයෙහි අර්ථය සරල බසින් ලියන්න.

ii. මෙහි විස්තර කෙරෙන සිදුවීමට අදාළ නගරය කුමක් ද?

2. " අවකප්පනයෙන් සැදූ හසු රන අල්වා ඇදි ඇදි සේ දුවන්නා සේ එ ම කිය කියා පුතු නළවයි"

i. මෙහි ඇතුළත් උපමාව හා උපමේය ඔබේ වචනයෙන් ලියන්න.

ii. මේ ස්ත්‍රිය සැමියා ප්‍රතික්ෂේප කිරීමට හේතුව කුමක් ද?

3. " මැගේ මේ අභිමානය මැට වඩා සම්පත් ඇත්තන් ඇති හෙයින් සම්පතක් නිසාත් නො වෙයි. තමා ජාති සම්පන්න නො වන හෙයින් ජාතියක් නිසාත් නො වෙයි. රූපත් හෙයින් ඒ හා තමා දන්නා ශිල්ප පමණක් නිසා ය."

i. ඇයට අභිමානයක් ඇති කර ගැනීමට හේතු නොවන්නේ මොනවා ද?

ii. හේතු වූයේ කවර දේ ද?

4. "එදවස් බුදුහුත් අලුයම් වෙලේ ලොව බලන සේක් හුණදඬු අගට නැඟෙන්නට පෙරාතු ව තමන් වහන්සේගේ නුවණ නමැති හුණදඬු අග හුන්නවුන් දැක"

i. මෙහි ඇතුළත් අලංකාරය උපුටා දක්වා එය නම් කරන්න.

ii. බුදුරජාණන් වහන්සේ මේ ස්ථානයට වැඩම කරන්නට කල්පනා කරන්නේ කවර ප්‍රයෝජන සලකාගෙන ද?

5. "<u>....කෙළි ළඹ</u> බලන්නට රුස්වූවන් <u>කොක්සන් ගසන නියාවෙන්</u> ඇඟිලි පෑ හිඟි කොට ලා හුණදඬු අග සිට ලා නික්ම සිස් අහස ම සත් විටක් පෙත්තක් මෙන් සිසැරීලා බැස හුණ දඬු අග සිටියහ."

i. ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

ii. උග්ගසේන සිටු පුත්‍රයා ප්‍රෙක්ෂකයන් විස්මයට පත් කිරීම සඳහා සිදු කළේ කුමක් ද?

අන්තර්ගතය : එච්.එම්.ජේ.එස්. කුමාරසිංහ - ආනන්ද විද්‍යාලය, කොළඹ 10.
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල.

Copyright©www.e-thaksalawa.moe.gov.lk

6. " ඒ වේලාවට බුදුහුත් නුවර ඇතුළට වඩනා සේක් රැස් වූ පිරිස බව අග වුවත් සිටිනට සමර්ථ වූ තමන් වහන්සේ දිසාව බලත් මුත් වඩා උඩ සිටිනට බල නැති උග්ගසේනයන් දිසාව නොබලන ලෙස ඉටා වදාළ සේක.

i. බුදුරජාණන් වහන්සේ ඇති කර ගත් අධිෂ්ඨානය කුමක් ද?

ii. තමන්ගේ සරඹ නො බලා බුදුන් දිසාව ම බලා සිටි ජනයා දුටු විට උග්ගසේන තුළ හටගත් දුක්මුසු හැඟීම ප්‍රකාශ කිරීමට යොදා ගත් උපමාව ලියන්න.

7. "උග්ගසේන සිටුපුත්‍රයාණෝ **<u>කර'ග රහත් වන්නා සේ නො වන බව මුත් හුණ දඬු අග දී පිළිසිඹියා පත් රහත්ව</u>** හුණ දණ්ඩෙන් බැස පියා බුදුන් ළඟට ගොස් පසඟ පිහිටුවා වැඳ ගෙන මහණ කරන්නට ආරාධනා කළහ.''

i. ඉරි ඇඳි කොටසේ අර්ථය ලියන්න.

ii. බුදුරජාණන් වහන්සේ උග්ගසේන සිටු පුත්‍රයා පැවිදි කළේ කෙසේ ද?

8. "මේ උන් දෙන්නා කළ කී කටයුතු ය''

i. මේ කතාවේ සඳහන් පරිදි අදාළ තැනැත්තන් කළ කී දේ කවරේ ද?

ii. ඔවුන් ලත් ඵල විපාක මොනවා ද?

අන්තර්ගතය : එච්.එම්.ජේ.එස්. කුමාරසිංහ - ආනන්ද විද්‍යාලය, කොළඹ 10.
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල.

Copyright©www.e-thaksalawa.moe.gov.lk

**ක්‍රියාකාරකම iv**

පහත සඳහන් අර්ථ දෙන පද පාඩමෙන් උපුටා ඉදිරියෙන් ලියන්න.

i. නිදොස්/නිවරද

ii. දොස් සහිත/වරද සහිත

iii. මෙලොවට අයත්

iv. පරලොවට අයත්

v. වැරදි ලෙස පිළියෙල කොට/පුහුණු කොට යෙදූ

vi. ඉබේ හටගත්

vii. බඩු පොදි එසවීමෙන්/ඇදීමෙන්

viii. නො වැළකී/මග නොහැර

ix. ප්‍රීති ඝෝෂා

x. කනගාටුව

xi. ක්‍රීඩා නාටක

xii. දහහතර වතාවක් පමණ

xiii. කරකැවීලා

xiv. පඤ්චස්කන්ධයෙහි

xv. යෝග්‍ය දේ සිදු කළෝ

xvi. විස්තර කරන්නට

xvii. ස්වාමි පුරුෂයාට

xviii. කවටකමක්

xix. අසූ භාර දහසක්

xx. කුලවත්

අන්තර්ගතය : එච්.එම්.ජේ.එස්. කුමාරසිංහ - ආනන්ද විද්‍යාලය, කොළඹ 10.
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල.

Copyright©www.e-thaksalawa.moe.gov.lk

**ක්‍රියාකාරකම v**

1. සද්ධර්මරත්නාවලිය කතුවරයා බණ කතා රචසත් ව ඉදිරිපත් කිරීමේ දී

i. ගැමි ව්‍යවහාර භාෂාවත්

ii. පණ්ඩිත ප්‍රිය භාෂාවත් සම්මිශ්‍රණය කර ගෙන ඇති අන්දම එක් කරුණකට උදාහරණ දෙකක්වත් දෙමින් පැහැදිලි කරන්න.

2. උග්ගසේන සිටුපුත්‍රයා

i. නිසරු සමාජාකල්ප නොතකන්නෙකි.

ii. කෙසේ හෝ තම අරමුණ ජය ගන්නෙකි.

එක් කරුණකට උදාහරණ දෙකක්වත් දෙමින් සාකච්ඡා කරන්න.

3. ධර්මසේන හිමි චරිත නිරූපණයේ දී

i. හාස්‍යය හා උපහාසයත්

ii අනුකම්පාවත් ඉස්මතු කරයි.

එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පෙන්වා දෙන්න.

4. විවාහ ජීවිතය සාර්ථක වීමට ප්‍රේමය පමණක් නොව, කුමන හෝ ජීවන කර්මාන්තයක් දැන සිටීම ද වැදගත් බව උග්ගසේන සිටුපත්‍රයාගේ චරිතය ආශ්‍රයෙන් පෙන්වා දෙන්න.

5. “රසවත් කතාවක් කියා දෙන ගමන් ජීවිතයට වටිනා ධර්මෝපදේශ ඉදිරිපත් කිරීම සද්ධර්ම රත්නාවලියෙන් සිදු කෙරෙයි.” උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

අන්තර්ගතය : එච්.එම්.ජේ.එස්. කුමාරසිංහ - ආනන්ද විද්‍යාලය, කොළඹ 10.
සැකසුම : කසුන් ලහිරු ප්‍රියදර්ශන - අම්/දෙහිඅත්තකණ්ඩිය ජාතික පාසල.

Copyright©www.e-thaksalawa.moe.gov.lk